# සාන්ත ජුසේ මුනි
## මංගලෝත්සවය

### පළමුවන දේව ප්‍රකාශනය 2 සාමුවෙල් 7:4–6, 12–14, 16

*සාමුවෙල්ගේ දෙවන පොතෙන් උපටා ගත් කොටසකි.*

"ස්වාමින් වහන්සේ ඔහුට සිය පිය දාවිත්ගේ සිහසුන දානය කරන සේක."

තවද, එම රාත්‍රියේ සමිඳාණන් වහන්සේගේ පණිවුඩය නාතාන් වෙත පැමිණියේ ය. උන් වහන්සේ මෙසේ වදාළ සේක: "නුඹ ගොස්, සමිඳාණන් වහන්සේ මෙසේ කියන සේකැ යි මාගේ මෙහෙකරු වන දාවිත්ට කියන්න: 'මාගේ වාසස්ථානය සඳහා මට මාළිගාවක් ගොඩනඟන්නට යන්නේ නුඹ ද? මම ඉශ්රායෙල් සෙනඟ මිසරයෙන් ගෙනා දවසේ පටන් අද දක්වා ගෘහයක වාසය නොකොට කූඩාරමක ද මණ්ඩපයක ද වාසය කෙළෙමි. නුඹේ ආයු කාලය සම්පූර්ණ වී නුඹේ පියවරුන් සමඟ සැතපුණ කල්හි, මම නුඹෙන් පැවත එන නුඹේ ම දරුවෙකු නුඹට පසු ව රජකමට නංවා ඔහුගේ රාජ්‍යයෙහි ඔහු ස්ථිර කරන්නෙමි. ඔහු ම මාගේ නාමයට මාළිගාවක් ගොඩනඟන්නේ ය. ඔහුගේ රාජ්‍යයේ සිංහාසනය ද සදහට ම ස්ථිර කරන්නෙමි. මම ඔහුට පියෙක් වන්නෙමි: ඔහු මට පුත්‍රයෙක් වන්නේ ය. ඔහු අයුතුකම් කළොත් මම පියෙකු මෙන් ඔහුට ඉපලෙන් දඬුවම් කරන්නෙමි:මිනිසුන් පහර දෙන සේ ඔහුට පහර දෙන්නෙමි. නුඹේ වංශය ද රාජශ්‍රීය ද මා ඉදිරියෙහි සදහට ම ස්ථිර කරනු ලබන්නේ ය. නුඹේ සිංහාසනය සදහට ම පිහිටුවනු ලබන්නේ ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 89:1–4, 26, 28

පිළිතුර: ඔහුගේ පෙළපත සදහට ම පවතින්නේ ය.

ගීය : සමිඳුනි, ඔබේ තිර පෙම ගැන මම සදහට ම ගයන්නෙමි.
ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට පවසන්නෙමි.
ඔබේ තිර පෙම සදහට ම පවතින බව
මම ඒකාන්තයෙන් ම පිළිගනිමි:
ඔබේ විශ්වාසවන්තකම අහස මෙන් තිරසර බව මම දනිමි.

ඔබ මෙසේ වදාළ සේක:
"මා තෝරාගත් තැනැත්තා සමග මම ගිවිසුමක් කෙළෙමි.
මාගේ සේවක දාවිත්ට මම මෙසේ දිවුළෙම:
'මම ඔබේ පෙළපත සදහට ම පිහිටුවන්නෙමි.
පරපුරෙන් පරපුරට ඔබේ සිහසුන ගොඩනගන්නෙමි.' "

ඔහු මට මොර ගසමින්, 'ඔබ මාගේ දෙවිඳාණෝ ය,
මාගේ පියාණෝ ය, මාගේ ආරක්ෂක පර්වතයාණෝ ය.'
කියන්නේ ය. මම ඔහුට සදහට ම ප්‍රේම කරන්නෙමි:
ඔහු උදෙසා මාගේ ගිවිසුම ස්ථිර ව පවත්නේ ය.

## දෙවන දේව ප්‍රකාශනය රෝම 4:13, 16–18, 22

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"බලාපොරොත්තු රහිත තත්ත්වයකදී පවා
ඔහු දේව පොරොන්දුව විශ්වාස කළේය."

ආබ්‍රහම්ට හෝ ඔහුගේ දරු පෙළපතට හෝ ලෝකය උරුම වන්නේ ය. යන පොරොන්දුව කිසි සේත් නීතිය පිළිපැදීම නිසා ඇති වූවක් නොවේ. එය ඇති වූයේ ඇදහිල්ල නිසා සිදු වන ධර්මිෂ්ඨකම හේතුකොට ගෙන ය. මේ නිසා දේව පොරොන්දුව වරප්‍රසාදයේ ප්‍රතිඵලයක් වන පිණිස එය ඇදහිල්ල මත රඳා පවතී.

එසේ වන්නේ, ආබ්‍රහම්ගේ දරු පෙළපතට අයත් හැමට ම, එනම්, නීතිය අනුව ජීවත් වන අයට පමණක් නොව, අපගේ පියාණන් වන ආබ්‍රහම්ගේ ඇදහිල්ල අනුව ජීවත් වන අයටත්, ඒ පොරොන්දුව වලංගු වන බව සහතික කරන පිණිස ය. "මම ඔබ බොහෝ ජාතීන්ගේ පියා කොට පත් කෙළෙමි"යි ශුද්ධ ලියැවිල්ලෙහි ලියා ඇත්තේ මේ නිසා ය. ඒ පොරොන්දුව ආබ්‍රහම් ලැබුවේ තමා අදහන, මළවුන් හට ජීවිතය දෙන, නැති දේ ඇති කරන, දෙවියන් වහන්සේගෙන් ය. බලාපොරොත්තු රහිත තත්ත්වයක දී වුව ද ඔහු දෙවියන් වහන්සේගේ පොරොන්දුව විශ්වාස කෙළේ ය. ඔහු බොහෝ ජාතීන්ගේ පියා වූයේ, "එබඳු මහා පෙළපතක් ඔබට ඇති වන්නේය" යන කීම පරිදි ය. එබැවින් දෙවියන් වහන්සේ ඔහුගේ ඇදහිල්ල නිසා ඔහු දමිටු බව පිළිගත් සේක.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ගීතාවලිය 84: 4

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ ගෘහයෙහි වසන්නෝ
කොපමණ වාසනාවන්ත ද?
ඔව්හු නිරතුරු ඔබට පසස් ගී ගයන්නෝ ය.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 1:16, 18-21, 24

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### ජුසේ තුමා පිබිද ස්වාමීන් වහන්සේගේ දූතයා අණ කළ දෙය සිදු කළේය.

ජාකොබ්ට දාව මරිය තුමීගේ පුරුෂයා වූ ජෝසෙප් ද උපන්නෝ ය: මරිය තුමීගෙන් ක්‍රිස්තුස් නම් වූ ජේසුස් වහන්සේ උපන් සේක.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපත සිදු වූයේ මෙසේ ය: උන් වහන්සේගේ මෑණියන් වූ මරිය තුමී ජෝසෙප් හා විවාහ ගිවිසගෙන සිටිය දී, ඔවුන් එක් වන්නට පෙර, ශුද්ධාත්මයාණන් අනුහසින් ඈ ගැබ්ගෙන සිටින බව දැන ගන්නා ලදී.

ඇගේ ස්වාමි පුරුෂයා වන ජෝසෙප් සත් පුරුෂයෙකු වූ බැවින් ඇය ප්‍රසිද්ධියේ නින්දාවට නොපමුණුවන අදහසින් රහසින් ඇය අත්හැර දමන්නට සිතා ගත්තේ ය. එහෙත්, ඔහු මේ කාරණය ගැන කල්පනා කරමින් සිටිය දී, සමිඳාණන් වහන්සේගේ දූතයෙක් සිහිනයකින් ඔහුට දර්ශනය වී, "දාවිත්ගේ පුත් ජෝසෙප්, ඔබේ බිරිඳ වන මරියා පාවාගන්නට බිය නොවන්න: මන්ද, ඈ ගැබ්ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන් අනුහසින්.

ඈ පුතෙකු බිහි කරන්නී ය: උන් වහන්සේට 'ජේසුස්' යන නාමය තැබිය යුතුය: මන්ද, සිය සෙනඟ ඔවුන්ගේ පාපවලින් මුදාලන්නේ එතුමාණෝ ය"යි කී ය. ජෝසෙප් නින්දෙන් අවදි වූ විට ස්වාමීන් වහන්සේගේ දූතයා ඔහුට අණ කළ ලෙස, සිය බිරිඳ කැන්දාගෙන ගියේ ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

*හෝ*

## සුවිශේෂය ලූක් 2: 41–51

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"බලන්න, ඔබේ පියා ද, මම ද, දුකින් තැවී, ඔබ සෙව්වෙමු."

ජේසුස් වහන්සේගේ මවුපියෝ අවුරුදු පතා පාස්කු උළෙල සඳහා ජෙරුසලමට ගියහ. උන් වහන්සේ දොළොස් සැවිරිදි වූ කල, ඔව්හු සිරිත් ලෙස ඒ මංගල්‍යයට ගියහ. ඔවුන් නියමිත දවස් ගෙවා පෙරළා එන අතර, ජේසුස් කුමරාණෝ ජෙරුසලමෙහි රැඳුණු සේක, එහෙත්, උන් වහන්සේගේ දෙමවුපියෝ ඒ බව නොදැන, උන් වහන්සේ වන්දනාකාර පිරිස සමඟ ඇතැ යි සිතාගෙන, දවසක ගමන් ගොස්, නෑ මිතුරන් අතරෙහි උන් වහන්සේ සෙවූ හ. එහෙත් සම්බ නොවූයෙන්, ඔව්හු උන් වහන්සේ සොයමින් ජෙරුසලමට පෙරළා ගියහ.

තෙදිනකට පසු ඔව්හු උන් වහන්සේ දේව මාළිගාවෙහි පඬිවරයන් මැද වැඩ හිඳ ඔවුන් කී දේ අසමින් ද ඔවුන්ගෙන් ප්‍රශ්න විචාරමින්ද සිටිනු දුටුවෝ ය. ඒ ඇසූ සියල්ලෝ ම උන් වහන්සේගේ බුද්ධි මහිමය හා පිළිතුරු ගැන විස්මිත වූ හ. දෙමවුපියෝ උන් වහන්සේ දුටු කල මවිත වූ හ. උන් වහන්සේගේ මෑණියෝ, "පුතා, කුමක් නිසා අපට මෙසේ කෙළෙහි ද? බලන්න, ඔබේ පියා ද මම ද දුකින් තැවි තැවී ඔබ සෙව්මු"යි කී හ. එවිට උන් වහන්සේ පිළිතුරු දෙමින්, "ඔබ මා සෙව්වේ මන් ද? මා පියාණන්ගේ මැඳුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නහු දැ"යි ඔවුන්ට වදාළ සේක. එහෙත්, උන්වහන්සෙගේ ඒ කීම ඔවුන්ට අවබෝධ නො වී ය.

උන් වහන්සේ ඔවුන් කැටුව ගොස් නාසරෙත් නුවරට පැමිණ ඔවුන්ට කීකරු වී විසූ සේක. උන් වහන්සේගේ මෑණියෝ මේ සියල්ලක් ම සිත්හි නිදන් කර ගත්හ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*